# 2025-03-17 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ

**01. රජයට අයත් වාණිජමය නොවන ආයතන පිළිබඳ සමාලෝචන වාර්තාව ඉදිරිපත් කිරීම**

රජයට අයත් වාණිජමය නොවන ආයතන පිළිබඳ සමාලෝචනය කර වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා අග්‍රාමාත්‍ය ලේකම්ගේ සභාපතිත්වයෙන් යුතුව නිලධාරි කමිටුවක් පත් කිරීමට 2024-12-18 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කරනු ලැබ ඇත. එම කමිටුව විසින් ආයතන 160ක් සමාලෝචනය කර ඇති අතර ඉන් විශ්වවිද්‍යාල ඇතුළු උසස් අධ්‍යාපන 36ක් සමාලෝචනය කිරීම සඳහා ක්ෂේත්‍රයේ සාමාජිකයින්ගෙන් සමන්විත අනුකමිටුවක සහාය ලබා ගැනීමට තීරණය කර ඇත. එම ආයතන හැර ඉතිරි ආයතන 124 කාණ්ඩ 09ක් යටතේ වර්ගීකරණය කරමින් කමිටුවේ නිර්දේශ ඉදිරිපත් කර තිබේ. ඒ අනුව, එකී නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිණිස ගරු අග්‍රාමාත්‍යතුමිය ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**02. ජපාන රජයේ ආර්ථික හා සමාජ සංවර්ධන වැඩසටහන යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අපනයන සැකසුම් කලාපවල ගිනි නිවන ඒකක ස්ථාපිත කිරීම සහ උපකරණ වැඩිදියුණු කිරීම**

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වන අපනයන සැකසුම් කලාප තුළ නවීන ගිනි නිවන උපකරණ සහිත අභ්‍යන්තර ගිනි නිවන ඒකක ස්ථාපිත කිරීම මගින් ආයෝජකයින් තුළ විශ්වාසය ගොඩනැංවීමට හැකි වන බවත්, ක්ෂණික ප්‍රතිචාර හරහා ශ්‍රමිකයින් හා කර්මාන්ත දේපළ ආරක්ෂා කර ගනිමින් හානි අවම කර ගැනීමට හැකි වන බවත් හඳුනාගෙන ඇත. ඒ සඳහා ජපන් ආර්ථික හා සමාජ සංවර්ධන වැඩසටහන යටතේ ජපන් යෙන් මිලියන 300ක (ආසන්න වශයෙන් රුපියල් මිලියන 590ක) ප්‍රදානයක් මඟින් කටුනායක, බියගම, සීතාවක සහ වතුපිටිවල අපනයන සැකසුම් කලාප සඳහා ලීටර් 4000ක ධාරිතාවයකින් යුත් ගිනි නිවන රථ 4ක් සහ උපකරණ කට්ටල 12ක් ලබා දීමට ජපාන රජය විසින් එකඟතාව පළ කර තිබේ. මෙම ව්‍යාපෘතිය සම්බන්ධීකරණය සහ ක්‍රියාත්මක කිරීම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් කොළඹ මහ නගර සභාවේ ගිනි නිවන දෙපාර්තමේන්තුවේ තාක්ෂණික සහයෝගිතාව මත සිදු කිරීමට නියමිතය. ඒ අනුව, යෝජිත ප්‍රදානය ලබා ගැනීම සඳහා අදාළ හුවමාරු පත්‍ර සහ අනෙකුත් ලියකියවිලි අත්සන් කිරීම සඳහා මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

03. අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය සංශෝධනය කිරීම

අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය 2023-07-01 වන දින සිට ක්‍රියාත්මක කරනු ලබන අතර, අංක 2415/66 හා 2024-12-21 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් මෙම යෝජනා ක්‍රමය අවසාන වරට සංශෝධනය කරනු ලැබ ඇත. 2025 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු මඟින් වෙන් කරනු ලැබ ඇති ප්‍රතිපාදන තුළ දැනට බලපවත්නා අස්වැසුම ප්‍රතිලාභ ගෙවීම් යෝජනා ක්‍රමය යටතේ ලබා දෙන ප්‍රතිලාභ පහත සඳහන් පරිදි සංශෝධනය කරමින් ගැසට් නිවේදනයක් මඟින් ප්‍රකාශයට පත් කිරීම සඳහා මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

* අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් යෝජනා ක්‍රමයේ I වන උපලේඛනයේ අඩංගු සංක්‍රාන්තික සමාජ කාණ්ඩය සඳහා ප්‍රතිලාභ හිමිවන කාලපරිච්ඡේදය 2025-04-30 දක්වා දීර්ඝ කිරීම.

* එකී යෝජනා ක්‍රමයේ II වන උපලේඛනයේ අඩංගු ආබාධ සහිත තැනැත්තන් සඳහා පිරිනමනු ලබන මාසික ආධාර මුදල සහ වකුගඩු ආධාර ලබන තැනැත්තන් සඳහා පිරිනමන මාසික ආධාර මුදල රුපියල් 7,500 සිට රුපියල් 10,000 දක්වා ඉහළ නැංවීම සහ වැඩිහිටි තැනැත්තන් සඳහා පිරිනමනු ලබන මාසික ආධාර මුදල රුපියල් 3,000 සිට රුපියල් 5,000 දක්වා ඉහළ නැංවීම සහ එම තීරණය 2025 අප්‍රේල් මස සිට ක්‍රියාත්මක කිරීම.

* II වන උපලේඛනයේ දැක්වෙන ආධාර ලබන ආබාධ සහිත තැනැත්තන් සඳහා දීමනාව, වකුගඩු රෝගී තැනැත්තන් සඳහා වන දීමනාව සහ වැඩිහිටි තැනැත්තන් සඳහා වන දීමනාව ඉහත යෝජනාවලට යටත්ව, ගෙවීම් කාලසීමාව 2025-12-31 දක්වා දීර්ඝ කිරීම.

* 2025 අප්‍රේල් මාසයෙන් පසු සංක්‍රාන්තික සමාජ කාණ්ඩය යටතේ දීමනා ගෙවීම නතර වුවත්, එම පවුල්වල සිටින ආබාධ සහිත තැනැත්තන්, වකුගඩු රෝගීන් සහ වැඩිහිටි පුද්ගලයින් සඳහා පිරිනමනු ලබන ප්‍රතිලාභ දීමනා ගෙවීම් කාලසීමාව 2025-12-31 දක්වා දීර්ඝ කිරීම.

* අලුතින් ඉදිරිපත් වී ඇති ආබාධ සහිත තැනැත්තන් සහ වකුගඩු රෝගීන්ගේ අයදුම්පත් උපරිම සීමාවට යටත්ව, ඇතුළත් කර ගනිමින් සුදුසුකම් ලබන්නන්ට 2025-12-31 දින දක්වා අදාළ දීමනා ගෙවීම.

**04. ජාතික තීරු බදු ප්‍රතිපත්ති කමිටුව සඳහා වන කාර්යය නිර්ණේය අනුදේශ (Terms of Reference)**

ආසියානු කලාපය තුළ තරඟකාරී වෙළෙඳපොළක් බිහි කිරීම සඳහා සහ ආයෝජන ගමනාන්තයක් බවට ශ්‍රී ලංකාව පරිවර්තනය කිරීමේ අරමුණින් විනිවිදභාවයකින් යුත් සහ දරා ගත හැකි බදු ක්‍රමයක් ඉලක්ක කර ගනිමින් ජාතික තීරුබදු ප්‍රතිපත්තියක් හඳුන්වා දීම සහ ක්‍රියාත්මක කිරීම පිණිස මීට පෙර අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. එහෙත්, එම කාර්යය සඳහා ජාතික තීරුබදු ප්‍රතිපත්ති කමිටුවක් පත් කිරීම හෝ එම කමිටුවේ කාර්යභාරය නිර්ණය කිරීම සිදු කර නොමැත. ජාතික තීරුබදු ප්‍රතිපත්ති කමිටුව සඳහා වන යෝජිත කාර්යය නිර්ණේය අනුදේශ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් සකස් කරනු ලැබ ඇත. ඒ අනුව, එකී කාර්යය නිර්ණේය අනුදේශ සඳහාත් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයෙකුගේ ප්‍රධානත්වයෙන් ජාතික තීරුබදු ප්‍රතිපත්ති කමිටුව පත් කිරීම සඳහාත් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**05. 2025 යල කන්නය සඳහා කුඹුරු ඉඩම්වල වගා කරනු ලබන ගොවීන් සඳහා පොහොර මූල්‍ය සහනාධාර ලබා දීම**

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග ඇමතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවක් සැලකිල්ලට ගනිමින්, 2025 යල කන්නයේ කුඹුරු ඉඩම්වල වී වගා කරනු ලබන ගොවීන් සඳහා සහ කුඹුරු ඉඩම්වල වෙනත් ක්ෂේත්‍ර භෝග වගා කරනු ලබන ගොවීන් සඳහා පහත සඳහන් පරිදි පොහොර මූල්‍ය සහනාධාර ලබා දීම පිණිස අනුමැතිය ලබා දීමට අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරන ලදී:

* 2025 යල කන්නයේදී කුඹුරු ඉඩම්වල සිදු කරන වී වගාව සඳහා හෙක්ටයාරයකට රුපියල් 25,000ක් බැගින් උපරිම වශයෙන් හෙක්ටයාර 02ක් සඳහා.

* කන්න රැස්වීම්වලදී තීරණය කරනු ලබන කුඹුරු ඉඩම්වල සිදු කරන වෙනත් ක්ෂේත්‍ර භෝග වගා සඳහා හෙක්ටයාරයකට රුපියල් 15,000/-ක් බැගින් උපරිම වශයෙන් හෙක්ටයාර 02ක් සඳහා.

06. **අධිබල විකිරණ ශක්තිය සහිත උසස් ගුණාන්වයෙන් යුක් විකිරණ චිකිත්සක උපකරණ සැපයීමේ ව්‍යාපෘතියේ II අදියර ක්‍රියාත්මක කිරීම**

පිළිකා සත්කාරක සේවා සඳහා යොදා ගනු ලබන රේඛීය ත්වරක යන්ත්‍ර 14ක් අදියර 2ක් යටතේ සැපයීම පිණිස 2013 වර්ෂයේදී එක්සත් රාජධානියේ Elekta සමාගම සහ සෞඛ්‍ය අමාත්‍යාංශය ගිවිසුමකට එළඹ ඇත. ඒ අනුව, එම ව්‍යාපෘතියේ I අදියර යටතේ ජාතික පිළිකා ආයතනයේ රේඛීය ත්වරක යන්ත්‍ර 04ක් ද මහනුවර ජාතික රෝහලේ යන්ත්‍ර 02ක් ද, ගාල්ල ජාතික රෝහලේ 01ක් ද, මඩකළපුව ශික්ෂණ රෝහලේ යන්ත්‍ර 01ක් ද, යාපනය තෙල්ලිපලෙයි මූලික රෝහලේ යන්ත්‍ර 01ක් ද වශයෙන් යන්ත්‍ර 09ක් මේ වන විට ස්ථාපිත කර තිබේ. ශ්‍රී ලංකා පිළිකා විශේෂඥ වෛද්‍යවරුන්ගේ විද්‍යායතනය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ද සැලකිල්ලට ගනිමින්, ව්‍යාපෘතියේ II අදියර යටතේ රත්නපුර, බදුල්ල, හම්බන්තොට, අනුරාධපුර සහ කුරුණෑගල යන රෝහල් 05 සඳහා උසස් තාක්ෂණයෙන් යුත් Infinity රේඛීය ත්වරක යන්ත්‍ර ස්ථාපිත කිරීමටත්, එම යන්ත්‍ර ස්ථාපිත කිරීමට හැකි වන අයුරින් අදාළ රෝහල් තුළ බංකර ඉදි කිරීම සඳහා පියවර ගැනීමටත් සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ නිර්දේශ අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

07. **ටෙනෙක්ටිප්ලේස් ඉන්ජෙක්ෂන් මිලි ග්‍රෑම 40 න් වයල් 6,000ක් සැපයීමේ ප්‍රසම්පාදනය**

හෘදයාබාධ ඇති වූ පුද්ගලයින් මරණයට පත් වීම වළක්වා ගැනීම සඳහා ලබා දෙන එන්නතක් වන ටෙනෙක්ටිප්ලේස් 40mg එන්නතින් වයල් 6000ක් මිල දී ගැනීම සඳහා ජාත්‍යන්තර තරඟකාරී ලංසු කැඳවීමේ ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් ලංසු කැඳවා ඇත. ඒ සඳහා ලංසු 03ක් ලැබී තිබේ. අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය මත පදනම්ව, සාරානුකූලව ප්‍රතිචාර දක්වන ලද අවම ලංසුකරු වන ශ්‍රී ලංකාවෙහි M/s Lifecerll Interventions (Pvt) Ltd (Manufacturer - Gennova Biopharmaceuticals Limited, India) වෙත අදාළ කොන්ත්‍රාත්තුව පිරිනැමීම පිණිස සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

08. **විදුලිබල පද්ධතිය ශක්තිමත් කිරීම සහ පුනර්ජනනීය බලශක්තිය ඒකාබද්ධ කිරීමේ ව්‍යාපෘතිය යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපදේශකයින් ප්‍රසම්පාදනය**

සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගමේ මෙහෙයුම් සිදු වන ප්‍රදේශවල විදුලි ඉල්ලුම ඉහළ යාම හේතුවෙන් එම ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන විදුලිය බෙදාහැරීමේ ජාලය ශක්තිමත් කිරීම හා නවීකරණය කිරීම සඳහා සම්ප්‍රේෂණ සංවර්ධන සහ බෙදාහැරීමේ ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කිරීම පිණිස "විදුලිබල

පද්ධතිය ශක්තිමත් කිරීම සහ පුනර්ජනනීය බලශක්තිය ඒකාබද්ධ කිරීමේ ව්‍යාපෘතිය" යටතේ ආසියානු සංවර්ධන බැංකුව විසින් අරමුදල් සැපයීමට එකඟතාව පළ කර ඇත. එම ව්‍යාපෘතිය යටතේ පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කිරීමට හඳුනා ගනු ලැබ තිබේ.

* කැලණිය ප්‍රදේශයේ ග්‍රිඩ් උපපොළක් හරහා ලංකා විදුලිබල මණ්ඩලයෙන් විදුලිබල සැපයුමක් ලබා ගැනීම.

* කැලණිය/මීගමුව සහ කෝට්ටේ/මීගමුව ප්‍රදේශවල ලංකා විදුලි පුද්ගලික සමාගමේ මධ්‍යම වෝල්ටීයතා ජාලය ශක්තිමත් කිරීම සඳහා කිලෝවෝල්ට් 33ක විදුලිබල සැපයුමක් හඳුන්වා දීම.

* කැලණිය සහ කෝට්ටේ/නුගේගොඩ හඳුනාගත් ප්‍රදේශ භූගත කේබල් ජාල බවට පරිවර්තනය කිරීම.

* කෝට්ටේ, නුගේගොඩ, මොරටුව සහ කළුතර ශාඛා ප්‍රදේශවල කිලෝවෝල්ට් 11ක ස්වයංක්‍රීය පෝෂක පද්ධති ප්‍රතිසැකසුම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.

* අධීක්ෂණ පාලන හා දත්ත උකහාගැනුම් පද්ධතිය සහ ජාල ස්වයංක්‍රීයකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම.

ඒ අනුව, එම ව්‍යාපෘති ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම පිණිස සුදුසු උපදේශකයින් තෝරාගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කිරීම පිණිස බලශක්ති අමාත්‍යතුමා ඉදිරිපත් කළ නිර්දේශය අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**09. 2022 අංක 9 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත සඳහා වූ සංශෝධන පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම**

2022 අංක 9 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත සංශෝධනය කිරීම සඳහා 2025-02-19 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. නීති කෙටුම්පත් සම්පාදක විසින් ඒ සඳහා සකස් කර ඇති සංශෝධන පනත් කෙටුම්පතට නීතිපතිගේ නිෂ්කාශනය ලැබී තිබේ. ඒ අනුව, පෞද්ගලික දත්ත ආරක්ෂණ (සංශෝධන) පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව අනුමැතිය පිණිස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් ඩිජිටල් ආර්ථික අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

10. **1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති පනත අහෝසි කිරීම සහ මූල්‍ය වාර්තාකරණ නියාමන කෙටුම්පත සකස් කිරීමේ කටයුතු අවසන් කිරීම**

1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති පනත පරිච්ඡින්න කර නව පනතක් හඳුන්වා දීම සඳහා 2021-05-24 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, ශ්‍රී ලංකා ගිණුම් හා සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය සහ අදාළ අනෙකුත් පාර්ශ්වයන්ගේ අදහස් ලබා ගැනීමෙන් අනතුරුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් මූල්‍ය වාර්තාකරණ නියාමන මූලික පනත් කෙටුම්පත සකස් කර තිබේ. එකී පනත් කෙටුම්පත සකස් කිරීමේ කටයුතු අවසන් කිරීම පිණිස නව අමාත්‍ය මණ්ඩලයේ ප්‍රතිපත්තිමය අනුමැතිය ලබා ගත යුතු බවට නීති කෙටුම්පත් සම්පාදක විසින් පෙන්වා දී ඇත. ඒ අනුව, එකී පනත් කෙටුම්පත සකස් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ එකඟතාව ලබා දීම පිණිස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

11. **1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත සහ (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනත යටතේ ප්‍රකාශයට පත්කරන ලද ගැසට් නිවේදනයන් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම**

මෝටර් වාහන ආනයනය කිරීම සඳහා වූ තාවකාලික අත්හිටුවීම ඉවත් කිරීමට සමගාමීව එම වාහන ආනයනය සඳහා 30%ක ආනයන තීරු බද්දක් පැනවීම පිණිස 2024-12-09 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලැබී තිබේ. ඒ අනුව, පහත සඳහන් අති විශෙෂ ගැසට් නිවේදන මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති ආඥාව සහ නියමය පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම පිණිස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:

* අංක 2421/05 හා 2025-01-27 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති 1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනතේ 2 වැනි වගන්තිය යටතේ වූ අංක 01/2025 දරන ආදායම් සංරක්ෂණ ආඥාව.

* අංක 2421/43 හා 2025-01-31 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති (235 වැනි අධිකාරය වූ) රේගු ආඥාපනතේ 10(අ) වගන්තිය යටතේ පනවන ලද නියමය.

12. **දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් තනතුරට පත් කිරීම**

දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වශයෙන් සේවය කළ ඩබ්ලිව්.ඒ.එස්. චන්ද්‍රසේකර මහත්මිය 2025-02-28 දින සිට රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලබා ඇත. ඒ අනුව, පුරප්පාඩු වී ඇති දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් තනතුර සඳහා දැනට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්වරියක වශයෙන් සේවය කරනු ලබන දේශීය ආදායම් සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරිනී ආර්.පී.එච්. ප්‍රනාන්දු මහත්මිය වහාම ක්‍රියාත්මක වන පරිදි පත් කිරීම පිණිස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

13. **කම්කරු කොමසාරිස් ජනරාල් තනතුරට පත් කිරීම**

කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු කොමසාරිස් ජනරාල් වශයෙන් දැනට සේවය කරනු ලබන එච්.කේ.කේ.ඒ.ජයසුන්දර මහතා මේ වන විට එම දෙපාර්තමේන්තුවේ වසර 23ක පමණ සේවා කාලයක් සපුරා ඇති බැවින් වෙනත් තනතුරක සේවය කිරීමට හැකි වන පරිදි කම්කරු කොමසාරිස් ජනරාල් තනතුරින් මුදාහරින ලෙස ඉල්ලීමක් කර ඇත. එබැවින්, වෙනත් සුදුසු තනතුරකට පත් කිරීමට හැකි වන පරිදි ඒ මහතා රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය වෙත අනුයුක්ත කිරීමටත්, ඒ අනුව, පුරප්පාඩු වන කම්කරු කොමසාරිස් ජනරාල් තනතුරට දැනට රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයට අනුයුක්තව සිටින ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරිනී එච්.එම්.ඩී.එන්.කේ. වටලියද්ද මහත්මිය පත් කිරීමටත් කම්කරු අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

14. **2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ 156 වගන්තිය යටතේ නියෝග**

2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ 156(1) වගන්තිය ප්‍රකාරව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විමසා එකී පනත යටතේ නියම කරනු ලබන නියමිත කාරණා සම්බන්ධයෙන් වූ නියෝග සෑදීමට අධිකරණ විෂයභාර අමාත්‍යවරයාට බලය පැවරී ඇත. එකී පනතේ 82(1) වගන්තිය අනුව අදාළ වන සෑම තැනැත්තෙකු විසින්ම නියෝග මඟින් නියම කරනු ලැබිය හැකි යම් ආකෘතියකින් "වත්කම් හා බැරකම්" ප්‍රකාශ කළ යුතු වේ. "වත්කම් හා බැරකම්" යන්නෙන් ශ්‍රී ලංකාව ඇතුළත හෝ ඉන් පිටත, ඍජුව හෝ අර්ථදායක ලෙස හිමි නියෝග මඟින් එහි විස්තර නියම කරනු ලැබිය යුතු වත්කම්, බැරකම්, ආදායම්, වියදම් සහ පොලී මුදල් අදහස් කරනු ලැබේ. ඒ අනුව, 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ විධිවිධාන පරිදි සාදන ලද 2025 දූෂණ විරෝධී (වත්කම් හා බැරකම් ප්‍රකාශ) නියෝග

ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව, එකී නියෝග පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමටත් අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**********